සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education – Western Province

ශිෂ්‍යත්ව ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2026
පෙරහුරු ප්‍රශ්න පත්‍රය

කට්ටල අංක 04

EXAMINATION FOR GRADE FIVE STUDERNTS FOR SELECTION TO SCHOOL AND FOR THE AWARD OF BURSARIES

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය

I පත්‍රය

කාලය : පැය එකයි

විභාග අංකය : .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණු	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි.	
	V/I/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	
	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි.	
	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	
	V/II/S/CH


(1) 1 හා 2 ප්‍රශ්නවල දී ඇති රූප අතරින් පළමු රූපයට වඩා දෙවන රූපයේ ඇති වෙනස්කම් ගණන කීය ද?






(1) දෙකකි. (2) තුනකි. (3) තුනට වඩා වැඩි ය.


(2)







(1) දෙකකි. (2) තුනකි. (3) තුනට වඩා වැඩි ය.

(3) මෙම රූපයේ දැක්වෙන්නේ පැති හය P, Q, R, S, T සහ U ලෙස සළකුණු කර ඇති එකම දාදු කැටයක පිහිටීම් තුනකි.







ඉහත දාදු කැටයේ T අක්ෂරය සලකුණු කර ඇති පැත්තට විරුද්ධ පැත්තේ දැක්වෙන අක්ෂරය කුමක් ද?

(1) R (2) P (3) S

(4) කුලී වෑන් රථයක් කුලී ගමන් යාමේදී ගාස්තු අය කිරීම පිළිබඳව පහත ආකාරයට සඳහන් කර ඇත.

පළමු 5km	→	1km රුපියල් 125.00 යි.
දෙවන 5km	→	1km රුපියල් 100.00 යි.
ඉතුරු සෑම කිලෝමීටරයක් සඳහා		රු. 75.00 යි.

20km ක දුරක් යාමේදී එම කුලී වෑන් රථයට ගෙවිය යුතු මුළු මුදල කීය ද?

(1) රුපියල් 1750.00 (2) රුපියල් 1875.00 (3) රුපියල් 1900.00


(5) තාත්තා රුපියල් 350.00ක් දී කෙසෙල් ඇවරියක් මිලදී ගත්තේ ය. එම මුදල් ගෙවූ නිවැරදි පිළිතුර තෝරන්න.

(1) රුපියල් 20 නෝට්ටු 6ක් සහ රුපියල් 50 සහ රුපියල් 100 නෝට්ටු වලිනි.

(2) රුපියල් 20 නොට්ටු 5ක් සහ රුපියල් 50 සහ රුපියල් 100 නෝට්ටු වලිනි.

(3) රුපියල් 100 නොට්ටු 3ක් සහ රුපියල් 20 සහ රුපියල් 50 නෝට්ටු වලිනි.

- **පාසලක ස්ථාන කිහිපයක පිහිටීම සහ එම ස්ථානවලට ගමන් කරන මාර්ග දැක්වෙන දළ සටහනක් පහත දැක්වේ. ඒ අසුරින් අංක 6, 7 හා 8 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



(6) ළමයෙකු උදෑසන ප්‍රධාන දොරටුවෙන් පාසලට පිවිසෙන විට ඔහුගේ දකුණු අත දෙසින් ඉර පායාගෙන එමින් තිබුණි. ඒ අනුව බුදු මැදුර පිහිටා ඇත්තේ පන්තියට කුමන දෙසින් ද?

(1) උතුරු (2) නැගෙනහිර (3) බටහිර

(7) කාර්යාලය පිහිටා ඇත්තේ බුදු මැදුරට කුමන දෙසින් ද?

(1) නිරිත (2) ඊසාන (3) ගිනිකොණ

(8) ළමයෙකු ප්‍රධාන දොරටුවේ සිට තම පන්තියට යන විට වම් පසටත් දකුණු පසටත් හැරෙන වාර ගණන කීය ද?

(1) වම්පසට 3යි. දකුණු පසට 2යි.

(2) වම්පසට 2යි. දකුණු පසට 3යි.

(3) වම්පසට 3යි. දකුණු පසට 3යි.

- **පහත දැක්වෙන සටහන බලන්න.**

	පළමු තීරය ↓	දෙවන තීරය ↓	තෙවන තීරය ↓
පළමුවන පේළිය →	1	2	3
දෙවන පේළිය →	6	5	4
තුන්වන පේළිය →	7	8	9

පියවර 1 හා 2 සඳහන් ආකාරයට සටහන වෙනස් කරනු ලැබේ. ඒ ඇසුරින් අංක 9 සහ 10 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පියවර 1 - පළමු වන පේළිය තිබෙන තැනට දෙවන පේළියත් දෙවන පේළිය තිබූ තැනට පළමු වන පේළියත් මාරු කිරීම.

පියවර 2 - දෙවන තීරය තිබෙන තැනට තුන්වල තීරයත් තුන්වන තීරය තිබූ තැනට දෙවන තීරයත් මාරු කිරීම.


(9) වෙනස් කිරීම් වලින් පසු රූපයේ මැද කොටුවේ පිහිටන ඉලක්කම කුමක් ද?

(1) 2 (2) 3 (3) 4

(10) මුල් රූපයේ 9 ඉලක්කම තිබූ තැනට වෙනස් කිරීම්වලින් පසු පැමිණි ඉලක්කම කුමක් ද?

(1) 8 (2) 7 (3) 4

- **පහත දක්වා ඇති ගණිත ගැටලුව ඇසුරින් 11 හා 12 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



(11)  අගය කීය ද?

(1) රුපියල් 30.00 (2) රුපියල් 40.00 (3) රුපියල් 50.00

(12)  අගය කීය ද?

(1) රුපියල් 135.00 (2) රුපියල් 140.00 (3) රුපියල් 150.00

(13) පහත දැක්වෙන්නේ රුපියල් 2, රුපියල් 5 සහ රුපියල් 10 කාසි තුන බැගින් තබා ඇති ගොඩවල් තුනකි.



එක් ගොඩකින් කාසි එකක් ද, තවත් ගොඩකින් කාසි දෙකක් ද, අනෙක් ගොඩින් කාසි තුනක් ද ගෙන සෑදිය හැකි වැඩිම මුදල කොපමණ ද?


(1) රුපියල් 42.00 (2) රුපියල් 26.00 (3) රුපියල් 37.00

(14) 18m ක් දිග කම්බි කැබැල්ලක් පහසුවෙන්ම නවා සකස් කර ගත හැකි හැඩතල දෙක වන්නේ,

(1) A, B

(2) B, C


(3) A, C




(15) 2016 වර්ෂයේ උපන් සනුතිගේ දැන් වයස අවුරුදු 10කි. නමුත් මේ වන තෙක් ඇගේ උපන්දිනය යෙදුණු දින දෙකක් පමණක් පසුකර ඇත. මේ ප්‍රකාශය


(1) සත්‍යයක් විය හැකි ය. (2) අසත්‍යයක් විය හැකි ය. (3) කිව නොහැකි ය.


(16) වෙනස් රූපය තෝරන්න.



(17) රටාව අනුව ? ලකුණට ගැළපෙන සංඛ්‍යාව කීය ද?







(1) 49 (2) 19 (3) 39

(18) මිතුරන් කණ්ඩායමක් රාත්‍රී ආහාරය සඳහා අවන්හලකට ගියහ. රාත්‍රී ආහාර බිල රුපියල් 4800.00ක් විය. එම මුදල සමානව බෙදා ගැනීමට තීරණය කරන ලදී. නමුත් දෙදෙනෙක් මුදල් ගෙනත් නොතිබුණි. එම නිසා බිල්පත ගොවා දැමීමට අනෙකුත් මිතුරන්ට රුපියල් 200.00 බැගින් අතිරේක මුදලක් ගෙවීමට සිදු විය. කණ්ඩායමේ සිටි මිතුරන් ගණන කීය ද?

(1) 10 (2) 6 (3) 8

- **කම්මල්කරුවෙකු සතුව A, B, C, D හා E ලෙස බරෙන් අසමාන යකඩ බෝල 5ක් ඇත.**
  - A බෝලය B බෝලය මෙන් දෙගුණයකි.
  - B බෝලය C බෝලය මෙන් 4 ගුණයකි.
  - C බෝලය D බෝලය මෙන් හරි අඩකි.
  - D බෝලය E බෝලය මෙන් හරි අඩකි.
  - E බෝලය A බෝලයට වඩා බර අඩු නමුත් C බෝලයට වඩා බර වැඩි ය.

(19) මෙම යකඩ බෝලවලින් බර වැඩි කුමක් ද?

(1) A (2) B (3) E

(20) පහත කුමන බෝලයට වඩා E බෝලය බර අඩු ද?

(1) A (2) B (3) D

(21) මෙම යකඩ බෝලවලින් බර අඩුම කුමක් ද?

(1) B (2) C (3) D


(22) අඹ, ජම්බු, පේර සහ රඹුටන් ගස් 4ක ගිරවු සිටිති. මෙහි සිටින මුළු ගිරවුන් ගණන 24කි. අඹ ගසෙන් ගිරවු තුන් දෙනෙක් ජම්බු ගසට ද ජම්බු ගසෙන් ගිරවු දෙදෙනෙක් පේර ගසට ද රඹුටන් ගසෙන් එක ගිරවෙක් පේර ගසට ද ඉගිලි ගිය විට ගස් හතරේ ම සිටින ගිරවු ගණන සමාන වේ. පේර ගසේ මුලින්ම සිටි ගිරවු ගණන කීය ද?

(1) 3 (2) 6 (3) 7

(23) සිත්මි, සඳුනි, දර්ශි, පවිත්‍රා සහ සුසීමා යන පස් දෙනා අතරින් සිත්මිට වඩා වයසින් වැඩිමල් සිව් දෙනෙකි. දර්ශිට වඩා සිව් දෙනෙක් වයසින් බාල ය. පවිත්‍රාට වඩා දෙදෙනෙක් වයසින් වැඩිමල් ය. සුසීමාට වඩා බාල එක් අයෙකු පමණි. පවිත්‍රාට වඩා වයසින් වැඩිමල් කවුරුන් ද?

(1) දර්ශි සහ සඳුනි (2) සුසීමා සහ සිත්මි (3) සඳුනි සහ සුසීමා

- **A, B, C භාජන තුනකි.**



A **B** **C**

  - A භාජනය B භාජනයේ පතුල මෙන් දෙගුණයක් විශාල ය.
  - C භාජනයේ පතුල B භාජනයේ පතුල මෙන් හරි අඩකි.
  - A භාජනයට ජලය ලීටරයක් දැමූ විට ජල කඳේ උස 3cm කි.

(24) C භාජනයට ජලය ලීටරයක් දැමූවිට එහ ජල කඳේ උස කොපමණ ද?

(1) 6cm (2) 8cm (3) 12cm

(25) B භාජනයට ජලය 500ml දැමූ විට එහි ජල කඳේ උස කොපමණ ද?

(1) 3cm (2) 6cm (3) 12cm

(26) පොල් අතු වියන්නියන් දෙදෙනෙකුට මිනිත්තු 10කදී පොල් අතු 2ක් විවීමට හැක. මිනිත්තු 10ක දී පොල් අතු 30ක් විවීමට අවශ්‍ය පොල් අතු වියන්නියන් ගණන කීය ද?

(1) 15 (2) 20 (3) 30

(27) ඔරලෝසුවක වේලාව 1.00, 2.00, 3.00 ආදී වශයෙන් වන විට පිළිවෙළින් එක් වරක්, දෙවරක්, තුන්වරක් ආදී වශයෙන් නාද වෙයි. ඒ අතුරෙන් 30වන මිනිත්තුවේදී එක්වරක් බැගින් නාද වෙයි. කමල් ඉරිදා පෙ.ව. 9.15ට පාඩම් කිරීම ආරම්භ කොට පෙ.ව. 11.45ට අවසන් කරන ලදී. ඔරලෝසුව එම කාලයේදී නාද වූ වාර ගණන කීය ද?

(1) 16 (2) 24 (3) 25

- පහත දැක්වෙන මිල ගණන්වලට අදාළව සමන්, කමල්, සුනිල් සහ අමර යන හතර දෙනා පහත දැක්වෙන බඩු මලු මිලට ගත්තේ ය.

සමන්		කමල්		සුනිල්		අමර	
අල	3kg	අල	1kg	අල	2kg	අල	1kg
කෝපි	1kg	කෝපි	2kg	කෝපි	3kg	කෝපි	2kg
තේ කොළ	2kg	තේ කොළ	1kg	තේ කොළ	1kg	තේ කොළ	2kg

අල 3kg	=	කෝපි 1kg
කෝපි 2kg	=	තේ කොළ 1kg

(28) වැඩි ම වටිනාකමක් ඇති බඩු මල්ල මිල දී ගත්තේ කවු ද?

(1) සමන් (2) කමල් (3) අමර

(29) අඩු ම වටිනාකමක් සහිත බඩු මල්ල මිල දී ගත්තේ කවු ද?

(1) සමන් (2) කමල් (3) සුනිල්

(30) කඩදාසි පටි අලවා සැකසූ දම්වැල් පහක් පහත දැක්වේ.



මේවා සියල්ල තනි දම්වැලක් සේ සකස් කිරීමට ගලවා ඇලවිය යුතු කඩදාසි පටි රවුම් අවම සංඛ්‍යාව කීය ද?

(1) 2 (2) 3 (3) 4

(31) රුවන් 7m ක් නැගෙනහිර දෙසට ගොස් උතුරට 3m ක් ගමන් කර නැවත 5mක් බටහිරට ගමන් කර යළිත් දකුණට 3m ක් ගමන් කරන ලදී. දැන් රුවන් සිටිනුයේ ආරම්භක ස්ථානයේ සිට කොපමණ දුරකින් ද?

(1) 2m (2) 3m (3) 4m

(32) අමල්ගේ වයස සනත්ගේ වයස මෙන් දෙගුනයක් විය. අමල් සහ විමල්ගේ වයස්වල එකතුව අවුරුදු 80කි. වෙනස 32කි. සනත්ගේ වයස සොයන්න.

(1) 13 (2) 24 (3) 28

- **එක්තරා ප්‍රශ්න පත්‍රයක ප්‍රශ්න 40ක් තිබේ. නිවැරදි පිළිතුරකට ලකුණු 2ක් ලැබන අතර වැරදි පිළිතුරක් සඳහා ලබාගත් ලකුණුවලින් ලකුණු 1ක් අඩු කරනු ලැබේ. ඒ අනුව ප්‍රශ්න 33හා 34 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(33) ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයූ සිසුවෙකුට ලකුණු 68ක් ලැබුණි නම් ඔහු නිවැරදිව පිළිතුරු සැපයූ ප්‍රශ්න ගණන කීය ද?

(1) 35 (2) 36 (3) 34

(34) ප්‍රශ්න 18කට වැරදි පිළිතුරු සැපයූ සිසුවෙකුට ලැබුණු ලකුණු සංඛ්‍යාව 10ක් නම් ඔහු පිළිතුරු නොලියූ ප්‍රශ්න සංඛ්‍යාව කීය ද?

(1) 24 (2) 17 (3) 8

(35) ඔරලෝසු මුහුණතක පැය කටුව එක් සංඛ්‍යාවක සිට ඊට ප්‍රතිවිරුද්ධ සංඛ්‍යාංකයකට ගමන් කිරීමේදී අතරමගදී පසුවන සංඛ්‍යාංක ගණන කීය ද?

(1) 4 (2) 5 (3) 6

(36) මා ළඟ ඇති පොත්වලින් 5 ක් හැර අනෙක් ඒවා සිංහල පොත් ය. 7 ක් හැර ඉතිරිය ගණිතය පොත් ය. 8 ක් හැර ඉතිරි ඒවා පරිසරය පොත් වේ. මා ළඟ ඇති මුළු පොත් ගණන කීය ද?

(1) 12 (2) 10 (3) 15

- **ළමයි පස් දෙනෙක් ඉදිරියට මුහුණලා පේළියක වාඩි වී සිටිති. මුල හා අග වාඩි වී සිටින්නේ ගයාන් හා කමල් ය. පැතුම් ගයාන්ගේ වම් පසින් නිමල්ට ආසන්නව සිටියි. පැතුම්ගේ දකුණු පසින් ගයාන්ට ආසන්නව තරිඳු සිටියි.**


(37) පැතුම් හා ගයාන් ස්ථාන මාරු කර ගත හොත් වම්පස කෙළවරේ සිට සිව්වෙනියාට සිටින්නේ කවු ද?

(1) තරිඳු (2) නිමල් (3) ගයාන්

(38) මුලින් දී ඇති නොරතුරු අනුව පේළියේ හරි මැද වාඩි වී සිටින්නේ කවුරුන් ද?

(1) පැතුම් (2) ගයාන් (3) තරිඳු

- **පහත සටහනේ A සිට O තෙක් ඉංග්‍රීසි අකුරුවලින් පෙන්වා ඇති සටහන අනුව 39 සහ 40 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**



A ළමයාගේ සිට පිළිවෙළින් දක්ෂිණාවර්තව 2, 4, 6, 8, 10 ලෙස ඉදිරියට ගණන් කිරීම ආරම්භ කරන ලදී. එහිදී පළමුවෙන් ම තුනෙහි ගුණාකාරයට අයත් සංඛ්‍යා හිමි ඉංග්‍රීසි අකුරු ඇති දරුවන් තරගයෙන් ඉවත් වන අතර 5 වන තරගකරුවා ඉවත් වීමෙන් පසු හතරේ ගුණාකාරයට අයත් ඉංග්‍රීසි අකුරු හිමි දරුවන් තරගයෙන් ඉවත් විය. ඒ අනුව අවසානයේ තරගකරුවන් 5 දෙනෙකු පමණක් ඉතිරි විය.

(39) නව වන වරට තරගයෙන් ඉවත්ව යන තරගකරුවාට අයත් දෙකේ ගුණාකාර වලට හිමි අංකය විය හැක්කේ කුමක් ද?

(1) 28 (2) 20 (3) 16

(40) තුනෙහි ගුණාකාර හා හතරෙහි ගුණාකාර හිමි ළමුන් තරගයෙන් ඉවත් වීමෙන් පසු අවසන් වරට දරුවන් පස් දෙනෙක් තරග බිම තුළ ඉතිරි වේ. එම තරගකරුවන් පිළිවෙළින් ඇති පිළිතුර වන්නේ,

(1) A, E, H, K, M (2) A, E, G, K, M (3) A, D, H, G, O

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education – Western Province

ශිෂ්‍යත්ව ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2026
පෙරහුරු ප්‍රශ්න පත්‍රය

කට්ටල අංක 04

EXAMINATION FOR GRADE FIVE STUDERNTS FOR SELECTION TO SCHOOL AND FOR THE AWARD OF BURSARIES
පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

කාලය : පැය එකයි මි. 15

විභාග අංකය : .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණු	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි.	V/I/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි.	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	V/II/S/CH

(1) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට ඡේදය ඇසුරින් පමණක් පිළිතුරු ලියන්න.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය පිහිටි භූමිය ඉතා අලංකාර ය. දෙපස ගස්වලින් පිවිසුම් මාර්ගය සෙවණ වී ඇත. මැයි මාර, රොබරෝසියා ආදී ගස්වලින් කඩා හැලෙන කහ පැහැති මල් විටින් විට වැටෙන්නේ මල් වැස්සක් වසින්නාක් මෙනි. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් මේ පරිසරයේ ඔබ මොබ ගමන් කරනු අපට දක්නට ලැබුණි. එක දිනකින් නැරඹීමට නොහැකි තරම් විශ්වවිද්‍යාලය ඉතා විශාල බැවින් අපි ප.ව. 2.00ට පමණ විශ්වවිද්‍යාල ආපණ ශාලාවෙන් ආහාර ගෙන සවස් වන විට පාසල කරා පැමිණියෙමු.

(i) දෙපස ගස්වලින් සෙවණ වී ඇත්තේ කුමක් ද? .....

(ii) මෙම පරිසරයේ ඔබ මොබ ගමන් කරනුයේ කවුරුන් ද? .....

(iii) ''ඇතුළුවීම්'' යන්නට සමාන අර්ථයක් දැක්වෙන ලෙස ඡේදයේ යොදා ඇත්තේ කුමක් ද?

.....

(iv) ඡේදයේ සඳහන් උපමාව ලියන්න. .....

(v) මෙහි සඳහන් ස්ථානය කුමක් ද? .....

(vi) කහ පැහැති මල් විටින් විට වැටෙන්නේ කුමකින් ද? .....

(2) පහත සඳහන් එක් එක් වගන්තියට ගැළපෙන නිවැරදි ආඛ්‍යාත පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(i) අයියාත් මමත් පාසල් ..... (ගියෙමි / ගියෙමු)

(ii) නයනි, පවනි සහ මාලා පන්සල් ..... (ගියෝ ය / ගියේ ය)

(iii) ඵළදෙන වැවට බැස වතුර ..... (බිවුවේ ය / බිවුවා ය)

(iv) වනය පුරා සතුන්ගේ නාදය ..... (පැතිරෙයි / පැතිරෙති)

(v) ගුරුවරු උදෑසන රැස්වීමට සහභාගී ..... (වෙයි / වෙති)

(3) පහත සඳහන් වාක්‍ය ලිඛිත බසට හරවා නැවත ලියන්න.

(i) අපි අලුත් ඇඳුම් ගන්න නගරයට ගියා.

.....

(ii) ඔහු වට්ටිය අරගෙන මල් වත්තට ගිහින් මල් කැඩුවා.

.....

(4) පහත සඳහන් එක් එක් වගන්තියේ වැරදි අක්ෂර සහිත වචන දෙක බැගින් ඇත. එම වචන පමණක් නිවැරදි කරමින් අදාළ තිත් ඉරි මත ලියන්න.

(i) අයහපත් කාලගුනය නිසා කුනාටුවෙන් දැඩි හානි සිදුවිය.

.....

(ii) ශෛල්‍ය වෛද්‍යවරයා රෝගීන්ට ප්‍රථිකාර කළේ ය.

.....

(5) පහත වචන නිවැරදිව ගළපා වගන්ති නැවත ලියන්න.

(i) සඳහා / විසඳුමක් / කළමනාකරණය / කසළ / තිරසර / වෙයි / අවශ්‍යතාවය / මතු

.....

(ii) පුංචි / සිහිනයක / දරියක් / ජීවත් / සිටියා ය / වූ

.....

(6) පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පදවල අදහස ලියන්න.

(i) ''කාව්‍යා ඒ ටිකට <u>අහසේ මාලිගා</u> හදලා නේ'' ගුරුතුමිය පැවසුවා ය.

.....

(ii) <u>උගත මනා ශිල්පය ම යි මතු රැකෙනා</u> යනුවෙන් පැරණි කියමනක් ඇත.

.....

(7) පහත දැක්වෙන වගන්තියෙහි අදාළ ස්ථානවල විරාම ලකුණු යොදන්න.

හරි අපූරු කතාවක්නේ මට කියවුනේ ඉඹේටම ය

(8) පහත දී ඇති වචනවල ඉරි ඇඳි අකුරට යෙදුණු පිල්ලම ලියන්න.

(i) <u>ත</u>රුණා - ..... (ii) <u>ග්‍ර</u>හස්ථ - .....

(9) ''කවියා'' යන වචනයෙහි ස්ත්‍රීලිංග පදය ලියන්න. .....

(10) පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.


(i) have / legs / I / four

.....

(ii) are / What / doing ? / you

.....

(11) එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය තිත් ඉරි මත ලියන්න.

(i)  ----------

(ii)  ----------

(12) එක් එක් ඉංග්‍රීසි වචනයෙහි අර්ථය සිංහලෙන් ලියන්න.

(i) Carpenter - ..... (ii) Paddy field - .....

(13) ''තලෙ'' යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න. .....

(14) පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

ගිරවා කොළ පාටයි .....


(15) දී ඇති සංඛ්‍යාව අකුරෙන් ලියන්න.

18050 .....

(16) පහත දී ඇති රෝම සංඛ්‍යාවට පෙර සංඛ්‍යාවත් පසුව ඇති සංඛ්‍යාවත් රෝම සංඛ්‍යාංකවලින් ලියන්න.

..... XV .....

(17)



(i) මෙම ඝනවස්තුවේ මුහුණත් ගණන කීය ද? .....


(ii) ඝන වස්තුවේ වක්‍ර දාර ගණන කීය ද? .....

(18) අඹ ගෙඩි 120කින් $\frac{1}{4}$ ක් නරක් විය. ඉතිරි හොඳ අඹ ගෙඩි ගණන සමන්, කමල්, හා පාලිත යන නමිතුරන් අතර සමානව බෙදන ලදී.

(i) අඹ ගොඩේ තිබුණු හොඳ අඹ ගෙඩි ගණන කීය ද? .....

(ii) එක් මිතුරෙකුට ලැබුණ අඹ ගෙඩි ගණන කීය ද? .....

(19) මෙම රූපයේ $\frac{1}{10}$ ක් අඳුරු කර ඇත. එය $\frac{1}{5}$ ක් වීමට තවත් අඳුරු කළ යුතු කොටු ගණන අඳුරු කරන්න.



(i) එවිට අඳුරු නොකර ඇති ඉතිරි වන කොටස භාගයක් ලෙස ලියන්න. .....

(ii) අඳුරු කළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න. .....

(20) විසඳන්න.


(i)

kg	g
12	75
+ 15	45

(ii)

l	m*l*
13	35
×	4

(21) A නගරයේ සිට B, C සහ D නගරවලට ඇති දුර පිළිබඳ තොරතුරු පහත දැක්වෙයි.



පුද්ගලයෙක් B සිට C හරහා D වෙත ගොස් ආපසු හැරී එම මාර්ගයෙන් ම C වෙත පැමිණෙයි. එහි දී ඔහු ගමන් කරන මුළු දුර සොයන්න. .....


(22) බස් රථයක් පෙ.ව.7.45ට මහනුවරින් ගමන් අරඹා පෙ.ව. 11.10ට කොළඹ කොටුවෙන් ගමන් අවසන් කරයි. ගමන සඳහා ගත වූ කාලය සොයන්න. .....

(23) පහත වේලාව කියවිය හැකි තවත් ආකාරයක් ලියන්න.
තුන පසුවී මිනිත්තු හතළිස් පහයි. .....

(24) අම්මාගේ අතෙහි ඇති බෑගයේ බර 3kg 50g කි. තාත්තාගේ අතෙහි ඇති බෑගයේ බර 6kg 75g කි. දෙදෙනොගේ ම අත්වල ඇති බෑගවල මුළු බර සොයන්න. .....


(25) දී ඇති තොරතුරු ඇසුරෙන් වගුවේ හිස්තැන් පුරවන්න.

සිට	**තෙක්**	**දුර**
කොළඹ	ගාල්ල	115km
කොළඹ	කළුතර	57km
පානදුර	ගාල්ල	79km
පානදුර	කළුතර	.....




(26) කාමරයක තීන්ත ආලේප කිරීමට තීන්ත 6*l* 750m*l* ක් අවශ්‍ය විය. නිවසක එවැනි කාමර 3ක් ඇත. ඒ සඳහා අවශ්‍ය තීන්ත ප්‍රමාණය සොයන්න. .....

(27) මෙම රූප තුළ ඇති සෘජුකෝණ සහ සෘජුකෝණයට වඩා වැඩි කෝණ අතර වෙනස කීය ද? .....



(28) මෙම ඝන වස්තුවේ ඇති සිරස්තල ගණන කීය ද? .....



(29) පහත බිල්පත සම්පූර්ණ කරන්න.

ද්‍රව්‍යය	**මිලදීගත් ප්‍රමාණය**	**කිලෝග්‍රෑම් 1ක මිල** **රු. ශත**	**වටිනාකම** **රු. ශත**
කෙසෙල්	1Kg 750g	120. 00	i) .....
සීනි	500g	ii)	117. 00
බිත්තර	7	iii)	332. 00
මුළු මුදල			.....

- **ප්‍රශ්න අංක 30 සිට 59 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(30) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා දෙනු ලබන සේවාවක් නොවේ,

(1) කොස් ගසක් කැපීමට බලපත්‍රයක් ලබා දීම. (3) ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම.

(2) වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීම.

(31) සෞරග්‍රහ මණ්ඩලයේ පෘථිවිය ආසන්න ම ග්‍රහයා ලෙස හැඳින්විය හැක්කේ,

(1) අඟහරු ග්‍රහයා (2) බුධ ග්‍රහයා (3) සිකුරු ග්‍රහයා

(32) කලා වැව හා යෝධ ඇළ යන නිර්මාණ ඉදි කිරීමට දායක වූ රජතුමා වන්නේ.

(1) ධාතුසේන රජතුමා (2) මහසෙන් රජතුමා (3) පරාක්‍රමබාහු රජතුමා

(33) තවාන් දමා පැළ ලබාගත හැකි බෝග වර්ග පමණක් අඩංගු පිළිතුර තෝරන්න.


(1) බෝංචි, මිරිස්,වට්ටක්කා (3) වැටකොළු, පතෝල, කව්පි

(2) මිරිස්, වම්බටු, තක්කාලි

(34) බිත්තර මගින් දළඹුවෙකු ලෙස බිහිවන ජීවන චක්‍රයක් සහිත සතෙකු වන්නේ,

(1) සමනලයා (2) ගෙම්බා (3) හූනා

(35) මෙම පැළෑටියේ මුල් ඉතා හොඳින් නිරීක්ෂණය කිරීමට වඩාත් ම සුදුසු වන්නේ,



(1) දුරදක්නය (2) අත් කාචය (3) කැඩපත

(36) ශ්‍රී ලංකාවට ආවේණික මත්ස්‍ය වර්ග දෙකකි.

(1) හීන් මැස්සා, ගල් පාඬියා (3) බුලත් හපයා, තෙප්පිලි

(2) වැලිගොව්වා, ලූලා

(37) බීම බෝතලයක ඇති රතු, කහ, සහ කොළ වර්ණ සහිත රටුම්වලින් පිළිවෙළින් අදහස් වන්නේ,

(1) අඩු සීනි අඩංගුය, මධ්‍යම සීනි අඩංගු ය, වැඩි සීනි අඩංගුය.


(2) මධ්‍යම සීනි, වැඩි සීනි අඩංගුය, අඩු සීනි අඩංගුය.

(3) වැඩි සීනි අඩංගුය, මධ්‍යම සීනි අඩංගුය, අඩු සීනි අඩංගුය.

(38) මුඛ ආශ්‍රිත රෝග සෑදීම, තුවාල සුව වීම පමාවීම සිදුවන්නේ පහත සඳහන් කුමන විටමින් ඌනතාවය නිසාද?

(1) විටමින් C (2) විටමින් B (3) විටමින් A


(39) මෙම ඇටවුමෙන් දැක්වෙන්නේ ළමයෙකු විසින් නිර්මාණය කරන ලද ජල රෝදයකි. එහි යෝගට් හැඳි ප්‍රමාණය අඩු කළේ නම්,



(1) කැරකෙන වේගය අඩුවේ. (3) කිසිවක් සිදු නොවේ

(2) කැරකෙන වේගය වැඩිවේ


(40) රූපයේ දැක්වෙන උපකරණය යොදා ගැනෙන්නේ,



(1) වඩු කර්මාන්තයේ දී (3) කෘෂි කර්මාන්තයේ දී

(2) ධීවර කර්මාන්තයේ දී

(41) බීජ පැළවීමට අවශ්‍ය සාධක සොයා බැලීමේ ක්‍රියාකාරකමක් සඳහා පිළියෙළ කර ගන්නා ලද බඳුන් හතරක් පහත දැක්වේ,



A B C D

A. සාමාන්‍ය කාමර උෂ්ණත්වයේ ජලය

B. සාමාන්‍ය කාමර උෂ්ණත්වයේ ජලයට පොල් තෙල් තට්ටුවක් දැමීම.


C. නටන තෙක් උණුකර නිවා ගත් ජලය

D. නාටන තෙක් රත්කල ජලයට පොල්තෙල් තට්ටුවක් දැමීම.

මෙම ක්‍රියාකාරකම ඇසුරෙන් හොඳින් බීජයක් පැළවෙන බඳුන වන්නේ,

(1) A (2) B (3) D

(42) මෙම පරීක්ෂණයෙන් තහවුරු වන්නේ,




(1) ජලය වාෂ්ප වන බව ය. (3) ජලය සිඳෙන බව ය.

(2) ජලයේ වර්ණය වෙනස් වන බව ය.

(43) විටමින් A බහුල ආහාර යුගලයකි.

(1) කොස් /කිරි (2) ගස්ලබු / මුරුංගා කොළ (3) කඩල / රටකජු

(44) පහත සඳහන් පරීක්ෂණය දෙස හොඳින් බලන්න. රූපයේ A භාජනයේ සහ B භාජනයේ දියර පිළිවෙළින්,



(1) ලුණු මිශ්‍ර ජලය, ජලය

(2) සීනි මිශ්‍ර ජලය, ලුණු මිශ්‍ර ජලය

(3) පිරිසිදු ජලය, ලුණු මිශ්‍ර ජලය

(45) භාවිතය අවම කරමු. නැවත භාවිත කරමු. ප්‍රතිචක්‍රීකරණය කරමු යනුවෙන් පවසන්නේ,

(1) 3R සංකල්පයේදී ය. (2) 5S සංකල්පයේදී ය. (3) ES සංකල්පයේදී ය.

(46) මෙම සංකේතය සහිත අපද්‍රව්‍ය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,




(1) සෘජු ව පරිසරයට බැහැර කළ හැකි ය.

(2) අපද්‍රව්‍ය එකතු කරන මධ්‍යස්ථානයක් වෙත බාරදිය යුතු .

(3) කොම්පෝස්ට් පොහොර සෑදීමට භාවිත කළ හැකි ය.

(47) යමක් ඉහළට එසවීමට භාවිත කරන මෙම සරල යන්ත්‍රය හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?



(1) කප්පි (2) කැස්ටර් වීල් (3) දැති රෝදය

(48) රූපයේ දැක්වෙන්නේ ''වටරවුම ඉදිරියෙනි'' යන්න හැඟවීමට දක්වා ඇති සංඥා පුවරුවයි. වාහන රියදුරන් වටරවුමක දී ඉඩ ලබා දී ධාවනය කළ යුතු වන්නේ,




(1) තම දකුණු පසින් එන වාහනවලට ය.

(2) තම වම් පසින් එන වාහනවලට ය.


(3) තමාට ප්‍රතිවිරුද්ධ පැත්තෙන් එන වාහනවලට ය.

(49) මෙම මැහුම් ක්‍රමය වන්නේ,



(1) දම්වැල් මැස්ම (2) බ්ලැන්කට් මැස්ම (3) කතිර මැස්ම

(50)



හිරු එළියේ වර්ණ වෙන්කොට බලා ගැනීමට සිදු කරන ලද ඇටවුමේ A ස්ථානයේ ඇති ඊතලයෙන් පෙන්වා ඇත්තේ කුමක් ද?


(1) වීදුරු කැබැල්ල (2) කැඩපත (3) ලෑල්ල

(51) සමනලයාගේ ජීවන චක්‍රයේ අවස්ථා අනුපිළිවෙළට ඇති පිළිතුර වන්නේ,

(1) බිත්තර, දළඹුවා, කෝෂය, සමනලයා (3) සමනලයා, දළඹුවා, කෝෂය, බිත්තර

(2) බිත්තර, කෝෂය, දළඹුවා, සමනලයා

(52) ප්ලාස්ටික් බෝතලයක පැත්තෙන් A, B සහ C සිදුරු තුනක් විද ඇත. බෝතලයට සම්පූර්ණයෙන්ම ජලය පිරවූ පසු වැඩි ම වේගයෙන් ජලය පිට කරන සිදුර කුමක් ද?



(1) A (2) B (3) C

(53) මෙම සිතියමේ අඳුරු කර ඇති පළාත් දෙක වන්නේ,



(1) බස්නාහිර පළාත සහ ඌව පළාත ය.


(2) වයඹ පළාත සහ ඌව පළාත ය.

(3) උතුරු මැද පළාත සහ මධ්‍යම පළාත ය.

(54) ''පිනවන දුටු දන සෑම - ගඟ ළඟ පිහිටි කඳීම.
තුරු පෙළ අවට සෑදීම - යුත් සෙවනැල්'' යන කවියෙක් කියැවෙන්නේ කුමක් පිළිබඳව ද?

(1) දෙනිපිටියේ නුග රුක (2) ලංකාවේ මුල් ම තේ ගස (3) ඕපනායක යෝධ පුස්වැල

(55) රූපයේ දැක්වෙන වැඩ පහසු කර ගැනීමේ ක්‍රමය,



(1) දැති රෝදයයි.
(2) දණ්ඩ සහ රෝදයයි.
(3) ආනත තලයයි.

(56) මහා මාර්ගයේ ගමන් කිරීමේ දී රියදුරන් විසින් නොකළ යුතු ය.

(1) දුරකථන භාවිත කරමින්, ආහාර ගනිමින් හෝ බීමතින් රිය පැදවීමෙන් වැළකීම.
(2) හැකි සෑමවිටම පාරේ වම් පැත්තෙන් අයිනෙන් රිය ධාවනය කිරීම.
(3) වාහනයක් පසුකර යාමේ දී ඉදිරියේ ඇති වාහනයට වම් පැත්තෙන් ඉස්සර කිරීම.

(57) තම ගෙළ එක කඩු පහරින් ගසා දමන ලෙස අවසන් ඉල්ලීම කළේ කවු ද?

(1) මොනරවිල කැප්පෙටිපොළ දිසාව
(2) ගොංගාලේ ගොඩ බණ්ඩා
(3) වීර පුරන් අප්පු

(58) පරිසරය පිරිසිදු කිරීම සම්බන්ධව කටයුතු කරන ආයතනයක් වන්නේ,

(1) ප්‍රාදේශීය සභාව හා නගර සභා
(2) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය සභාව
(3) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හා නගර සභාව

(59) උප්පැන්න සහතිකයේ පිටපත් ලබාගැනීමට අප යා යුත්තේ,

(1) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට
(2) ප්‍රාදේශීය සභාව
(3) ග්‍රාම සේවා නිලධාරී කාර්යාලයට

(60) **''මා ගිය හොඳම අධ්‍යාපන චාරිකාව''** යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක වැකි තුනක් ලියන්න. සෑම වාක්‍යයක්ම වචන පහකට නොඅඩු විය යුතු අතර උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.

(1) .....
.....
(2) .....
.....
(3) .....
.....

බස්නාහිර පළාත් කට්ටල අංක - 04

I පත්‍රය පිළිතුරු

1) 2 (තුනකි)
2) 3 (තුනට වඩා වැඩිය)
3) 2(P)
4) 2 (රු.1875.00)
5) 2 (රු.20 නෝට්ටු 5ක් හා100 නෝට්ටු)
6) 2 (නැගෙනහිර)
7) 1 (නිරිත)
8) 2 (වම්පසට 2, දකුණුපසට 3)
9) 2 (3)
10) 1 (8)
11) 2 (රු.40.00)
12) 2 (රු.140.00)
13) 1 (රු.42.00)
14) 3 (A,C)
15) 1 (සත්‍යයක් විය හැකිය)
16) 3
17) 1 (49)
18) 3 (8)
19) 1 (A)
20) 1 (A)
21) 2 (24)
22) 1 (C)
23) 1 (දර්ෂි සහ සඳුනි)
24) 3 (12CM)
25) 1 (3CM)
26) 3 (30)
27) 2 (24)
28) 3 (අමර)
29) 2 (කමල්)
30) 2 (3)
31) 1 (2M)
32) 3 (28)
33) 2 (36)
34) 3 (8)
35) 2 (5)
36) 2 (10)
37) 1 (තරිඳු)
38) 1 (පැතුම්)
39) 2 (20)
40) 2 (A,E,G,K,M)

බස්නාහිර පළාත් කට්ටල අංක - 04
II පත්‍රය පිළිතුරු

1)
- i. පිවිසුම් මාර්ගය
- ii. විශ්ව විද්‍යාල අධ්‍යාපන ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්
- iii. පිවිසුම්
- iv. මල් වැස්සක් වසින්නාක් මෙනි.
- v. පේරාදෙණිය විශ්ව විද්‍යාලය
- vi. මැයි මාර, රොබරෝසියා ආදී ගස්වලින්

2)
- i. ගියෙමු
- ii. ගියෝය
- iii. බිවුවාය
- iv. පැතිරෙයි
- v. වෙති

3)
- i. අපි අලුත් ඇඳුම් ගැනීමට නගරයට ගියෙමු.
- ii. ඔහු වට්ටිය රැගෙන මල් වත්තට ගොස් මල් කැඩුවේය.

4)
- i. කාලගුණය , කුණාටුවෙන්
- ii. ශල්‍ය , ප්‍රතිකාර

5)
- i. කසළ කළමනාකරණය සඳහා තිරසර විසඳුමක අවශ්‍යතාවය මතුවෙයි
- ii. සිහිනයක ජීවත් වූ පුංචි දැරියක් සිටියාය.

6)
- i. ඉටුනොවන සිහින මැවීම
- ii. උගත් ශිල්පය ම මතු ආරක්ෂාව සලසයි.

7) ‘‘හරි අපූරු කතාවක් නේ!’’ මට කියවුනේ ඉබේටම ය.

8)
- i. කෙටි ඇදපාපිල්ල
- ii. ගැට ඇලපිල්ල

9) කිවිඳිය

10)
- i. I have four legs.
- ii. What are you doing

11)

i. Pineapple

ii. Mosquito

12)
   i. වඩුකාර්මිකයා
   ii. කුඹුර
13) හිස/ඔළුව
14) කිළි පව්වෙ නිරම්
15) දහ අටදහස් පනහ
16) xiv , xvi
17)
   i. 2
   ii. 2
18)
   i. 90
   ii. 30
19)
   i. 9/10
   ii. 0.1
20)
   i. 27Kg 120g
   ii. 52L 140 ml
21) 208 km
22) පැය 03 මිනිත්තු 25
23) හතරට මිනිත්තු පහළොවයි / හතරට කාලයි
24) 9kg 125g
25) 21km
26) 20L 250ml
27) 4
28) 4
29)
   i. රු. 210.00
   ii. රු. 235.00
   iii. රු. 660.00
30) 3
31) 3
32) 1
33) 2
34) 2
35) 2
36) 1
37) 3
38) 1
39) 1
40) 2

41) 1
42) 1
43) 2
44) 3
45) 1
46) 2
47) 1
48) 1
49) 2
50) 2
51) 1
52) 3
53) 2
54) 1
55) 2
56) 3
57) 1
58) 1
59) 1